ප්‍රධාන ලේකම් කාර්යාලය

වයඹ පළාත් සභාව

සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2027

වයඹ පළාත් සභාවේ අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු ඇතුළු සියලු ආයතන වෙනුවෙන් 2027 වර්ෂයට භාණ්ඩ හා සේවා සම්පාදනය සඳහා සුදුසුකම්ලත් සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

භාණ්ඩ
1. මුද්‍රණ යන්ත්‍ර , ඡායා පිටපත් යන්ත්‍ර, අනු පිටපත් මුද්‍රණ යන්ත්‍ර හා ෆැක්ස් යන්ත්‍ර
2. පරිගණක යන්ත්‍ර , උපාංග හා මෘදුකාංග
3. කාර්යාල උපකරණ (වානේ/ලී /එම්.ඩී.එෆ්.බෝඩ් / මෙලමයින් / ප්ලාස්ටික්)
4. කාපට් හා ජනෙල් තිර රෙදි
5. ටෝනර් සහ රිබන්,කාට්ලේජ
6. වායු සමීකරණ යන්ත්‍ර (ගොඩනැගිලි)
7. කාර්යාලීය ලිපි ද්‍රව්‍ය
8. ටයර් , ට්‍යුබ් , බැටරි සහ වාහන අමතර කොටස්
9. විදුලි උපකරණ
10. රබර් මුද්‍රා , නාම පුවරු,බැනර්
11. ක්‍රීඩා උපකරණ
12. පිහිණුම් තටාක සඳහා රසායන ද්‍රව්‍ය
13. කායවර්ධන උපකරණ
14. ක්‍රීඩකයින් සඳහා ක්‍රීඩා ඇදුම් හා පාවහන්
15. වෛද්‍ය උපකරණ
16. වෛද්‍ය ලී බඩු උපකරණ
17. ඖෂධ
18. ආයුර්වේද වියලි ඖෂධ
19. රෝහල් සඳහා පිසුම්/වියළි ආහාර සැපයීම
20. සනීපාරක්ෂක අයිතම (විෂබීජ නාශක දියර/සබන්/ඩිටර්ජන්,එයාර් ප්‍රෙෂ්නා ආදිය)
21. සංගීත භාණ්ඩ
22. කෘෂි උපකරණ / කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර
23. කෘෂිකාර්මික බීජ , රෝපන ද්‍රව්‍ය , පොහොර හා කෘෂි රසායන ද්‍රව්‍ය
24. පශු ඖෂධ
25. සත්ව ආහාර
26. පශු ඖෂධ උපකරණ
27. ගොඩනැගිලි නඩත්තු උපකරණ (බල්බ් ,ජලනල උපාංග වැනි)
28. ඇමතුම් පද්ධති (අභ්‍යන්තර හා බාහිර) උපාංග
29. ජල සැපයුම් හා විදුලි බල සැපයුම් පද්ධති වලට අදාල උපාංග
30. විද්‍යාගාර උපකරණ
31. රෙදිපිලි ආශ්‍රිත නිශ්පාදන- අත්පිස්නා , මේස රෙදි
32. සියලුම පොලිතින් වර්ග- පැලතවාන් පැකට් / හරිතාගාර නෙට්
33. පානීය ජලය හා Dispenser
34. ධීවර දැල් වර්ග හා උපකරණ
35. GPS ඇතුලත් ධීවර තාක්ෂණ මෙවලම්
36. සෙවන දැල් , විසිතුරු මත්ස්‍ය උපාංග සහ රසායනික ද්‍රව්‍ය
37. CCTV හා ඇගිළි සළකුණු යන්ත්‍ර
සේවා
38. වාහන අලුත්වැඩියාව හා සේවා කිරීම කිරීම
39. පරිගණක යන්ත්‍ර , ඡායා පිටපත්,අනු පිටපත් යන්ත්‍ර අලුත්වැඩියාව
40. වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියාව (ගොඩනැගිලි)
41. වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියාව (වාහන)
42. විදුලි උපකරණ අලුත්වැඩියාව
43. කාර්යාලීය උපකරණ අළුත්වැඩියාව (මේස,පුටු, වානේ අල්මාරි වැනි) හා කාර්යාලීය පුටු විවීම
44. මුද්‍රණ කටයුතු හා පොත් බැඳීම
45. පිහිණුම් තටාක අලුත්වැඩියාව
46. කායවර්ධන උපකරණ අලුත්වැඩියාව
47. පිරිසිදු කිරීමේ සේවා සැපයීම
48. ආරක්ෂක සේවා සැපයීම
49. ආහාර පාන සැපයීම හා ආපන ශාලා පවත්වාගෙන යාම
50. කුලී පදනම් මත වාහන සැපයීම (කාර්,කැබ් වැනි) / ප්‍රවාහන සේවා
51. ඇමතුම් පද්ධති (අභ්‍යන්තර හා බාහිර) අළුත්වැඩියා කිරීම
52. CCTV කැමරා /ඇගිලි සලකුණු යන්ත්‍ර අළුත්වැඩියාව
53. යතුරු කැපීම හා ලොක් අළුත්වැඩියාව
54. වාහන අප්පෝස්ටර් වැඩ (වාහන ෂීට් කුෂන් / ෂීට් කවර/ රබර් කාපට්)
55. කාපට්,කුෂන් පුටු හා ජනෙල් තිර රෙදි පිරිසිදු කිරීම
56. පරිගණක මෘදුකාංග /වෙබ් අඩවි සකස්කර ගැනීම
57. රථවාහන රක්ෂණය
58. කිළිටි රෙදි සේදීම

01.<u>අයදුම්පත් ලබා ගැනීම</u>

ආදර්ශ අයදුම්පත හා කොන්දේසි පත්‍රිකාව www.cs.nw.gov.lk වයඹ පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ වෙබ් අඩවියට පිවිස බාගත කර ගැනීමට හෝ ප්‍රධාන ලේකම් කාර්යාලයේ ගිණුම් අංශය (විදුසර දොරටුව,දෙවන මහළ) වෙතින් 2026/12/10 දින දක්වා සතියේ දිනවල පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා ලබා ගත හැකිය.

02. <u>ලියාපදිංචි ගාස්තු ගෙවීම</u>

එක් කාණ්ඩයක් සඳහා රු.1500.00 ක් වන අතර කාණ්ඩ කිහිපයක් සඳහා ඉල්ලුම් කරන්නේ නම් එම වැඩිවන එක් කාණ්ඩයක් වෙනුවෙන් රු.500.00 බැගින් ගෙවීම් කළ යුතුය. මෙම ගෙවීම් වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයේ සරප් වෙත 2026.12.10 දක්වා සතියේ දිනවල පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා මුදලින් ගෙවීම් කිරීමට හෝ ලංකා බැංකුවේ,වයඹ මධ්‍යම ශාඛාවේ අංක **713975** දරණ ''ප්‍රධාන ලේකම්ගේ ගිණුමට'' බැරවන පරිදි ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවීම් කළ හැකිය.ඊට අදාළ තැන්පතු පත්‍රිකාවේ ව්‍යාපාර ආයතනයේ නම සඳහන් කිරීමට කටයුතු කළ යුතුය. (ATM හා විද්‍යුත් පැවරුම් මගින් සිදු කරනු ලබන මුදල් තැන්පතු සලකා බලනු නොලැබේ.)

03. <u>අයදුම්පත් භාර ගැනීම</u>

ලියාපදිංචිය සඳහා සම්පූර්ණ කළ අයදුම්පත්‍රය,කොන්දේසි පත්‍රිකාව,ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපත , පළපුරුද්ද සනාථ කිරීමට අදාල ලේඛන, මුදල් තැන්පතු කුවිතාන්සියේ මුල්පිටපත ලියුම් කවරයක බහා එහි වම්පස ඉහළ කෙළවරේ "2027 වසර සඳහා සැපයුම්කරුවන් ලියාපදංචි කිරීම " ලෙස සඳහන් කර 2026 /12/10 දින ප.ව. 3.00 ට හෝ ඊට පෙර ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය (ගිණුම් අංශය), වයඹ පළාත් සභා සංකීර්ණය, කුරුණෑගල යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ අතින් ගෙනවිත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයට භාර දීම කළ යුතුය.

විමසීම් - ගණකාධිකාරි, දුරකථන අංකය 037-2223332

ප්‍රධාන ලේකම්,
වයඹ පළාත.